''දැන් අමාරු නැහැ නේද...?'' කුමාර තමා ගෙන ආ පාර්සලය කුඩා මේසය මත තබන අතර ඇසුවේ ය. ''අපේ මිස්ට කොහොමද දන්නෙ නැහැ නේද අයියෙ...?''

අනුරාධ කල්පනා කරමින් සිටියේ ද ඒ පැනයම ය. නැවත වතාවක් ගොස් ඇගේ සුව දුක් බලා එන්නට දැඩි අවශ්‍යතාවක් ඔහු සිත තුළ විය. මේ මොහොතේ කුමාරගේ පැමිණීම භාග්‍යයකි.

''මල්ලිට බැරිද ගිහින් ටිකක් බලලා එන්න...?'' අනුරාධ වහා ඇසුවේ ය.

''මොකද බැරි.. යමු ... අපි දෙන්නම යමු... '' කුමාර අනුරාධගේ අතින් අල්ලා නැගිටින්නට වාරු දුන්නේ ය. විදුලි සෝපානය තෙක්ම ඔහු අනුරාධගේ අතින් අල්ලාගෙන ආවේ ය.

''නොම්මර 28 කාමරේ... කුමාර ගිහින් ටිකක් බලලා එන්න කවුරු හරි විසිටර්ස්ල ඉන්නවද කියලා... මං මෙතන ඉන්නම්...'' අනුරාධ කීවේ ය. නැවත වතාවක් දිලීපට මුහුණ දෙන්නට ඔහුට අවශ්‍ය නොවී ය. එසේ වුවහොත් එය ප්‍රශ්නයක් වන්නේ නිෂාධිට ය.

කුමාර ගිය සැණින් ආපසු දුව ආවේ ය.

''කවුරුත් නැහැ අනුරාධ අයියා... අය්යා යන්න... මං මෙතන ගාඩ් එක දාගෙන ඉන්නං...''

''උඹ නං නියම එකෙක්...'' අනුරාධ සිනාසුණේ ය.

නිෂාධි සිටියේ ඇඳ විට්ටමට හිස තබාගෙන දෑස් පියාගෙන ය. දිලීප ගිය වේලේ සිටම ඇගේ සිතට සහනයක් නොවී ය. ඉතා ඉක්මණින් ඔහු තමා ද රැගෙන ආපසු යන බව ස්ථිර ය. එයින් ගැලවෙන්නට තරම් ශක්තියක් තමා සතු ද...? තව දුරටත් හිත් පිත් නැති රූකඩයක් සේ දිලීපට අවනත විය යුතු ද...?

ඇය ඇස් ඇර බැලුවේ අනුරාධගේ කිහිලි කරු ශබ්දයටය.

''නිෂා...'' ඔහු දොර අසළ සිටම ඇය ඇමතුවේ ය. සියළු වේදනා මොහොතකින් පහව ගියාක් මෙන් නිෂාධිට දැනුණි. ඈ වේදනාව අතරින්ම සිනාසුණා ය.

ඔහු ඇඳේ ඇගේ හිස අසළින් වාඩි වූයේ ය. ඈ ඔහුගේ උරහිස මත හිස තබාගත්තා ය.

''මගේ අනු...'' ඈ මිමිණුවා ය. ඔහු වචනයකුදු නොදොඩා ඇගේ හිස සිපගත්තේ ය. ''...ඔයාට කොහොමද ... කකුලට මොකද වෙලා තියෙන්නෙ?'' ඈ ඇසුවා ය.

''ඒ හැටි අමාරුවක් නැහැ නිෂා.. මට වඩා ඔයාට අමාරුයි...'' ඔහු කිවේ කණගාටුවෙනි.

''මේ තරමින් බේරුණා මදැයි...'' ඈ ආයාසයෙන් සිනාසුණා ය.

''මම ඊයෙත් ආවා ඔයා බලන්න...'' ඔහු කිවේ ය. ඈ තිගැස්සුණා ය. ඊයේ සවස් වරුවම දිලීප කාමරයේ සිටි බව ඇයට සිහිපත් විය.

''මට දිලීප හමුවුණා...'' ඔහු සිනාසුණේ ය. ඈ සුසුමක් හෙලුවා ය. ''...මාව අඳුනන්නෙ නෑ වගේ හිටියා...''

''එයා එහෙම තමයි...'' නිෂාධි මිමිණුවා ය. ''...අනුරාධ... ''
''ම්''

''මට ආපහු යන්න වෙනවා අනුරාධ..'' වාක්‍යය අවසන් කරන්නට පෙර ඇගේ කටහඬ බිඳී ගියේ ය. ඈ සිහින් හඬින් ඉකි බින්දා ය. ඔහු මෘදු ලෙස ඇගේ හිස අතගෑවේ ය. ඇගේ කඳුලු ඔහුගේ උරහිස මත සීතලට තැවරුණි.

''මං ඔයාව යවන්නෙ නැහැ...'' ඔහු දැඩිව කීවේ ය.
''එහෙම කරන්නෙ කොහොමද අනුරාධ මට යන්න වෙනවා...'' ඈ මිමිනුවා ය.

අනුරාධ කිසිවක් නොකීවේ ය. ඈ නවතන්නට තමාට හැකියාවක් තිබේ ද?

සීතලේ කැටි ගැහුණ සිතුවිලි
උණුසුමට තුරුළු වන හැටි යළි
සුසුමකට නතුව යන හසරැළි
කෝම පවසනු හැකිද මැසිවිලි

සසර මඟ යන ගමන තව දුරයි
අතර මඟ නතර වනු බෑ දුකයි
නිතර නෙත පිරුණු කඳුළැලි ගලයි
සොඳුර නොදුටුවෙද මගෙ හිත හඬයි

''...අනු ... මං... ...මං පොරොන්දු වෙනවා... ගියත් මං ආපහු එනවා... මං ඔයා ළඟට එනවා... එනවාමයි''

''මට ඔයා විශ්වාසයි ...'' ඔහු කිවේ ය. ''... මේ තරම් දෙයක් අපි අතරේ වුණේ මොකක් හරි දෛවෝපගත බැඳීමක් නිසයි... ඒක මට දැනෙනවා... ඔයා කොයි දීපංකරේක හිටියත් මං ඔයා මගේ ළඟට ගන්නවා...''

0000000000000

දිලීප ගේ දුරකථනය නාද වූයේ ඔහු පැමිණි කුලී රිය රෝහල් බිමට ඇතුල් වන විටම ය.

''දිලීප.. මම සඳලි'' අනෙක් කෙළවරෙන් ඇසුණි. ''.මං හිතුවා ඔයා මට කෝල් එකක් වත් දෙයි කියලා. නිෂාධිට කො-හොම ද?''

දිලී දුරකතනය උරහිසට හිර කරගත්වන ම රියැදුරාට මුදල් ගෙවා රථයෙන් බැස්සේ ය.

''මම ළබන සුමානෙ ආපහු එනවා. නිෂාදිවත් එක්ක එනවා.'' ඔහු කීවේ ය.

''එයාට සනීප ද?' මෙහෙ එන්න තරම්.?' සඳලි ඇසුවා ය.

''සනීප වුණා හරි නොවුණා හරි ලබන සුමානෙ අපි එනවා.'' ඔහු වහා කීවේ ය.

''මොකද.? තියලා එනන් බැරි තරමට ප්‍රශ්නෙ ඔඩු දුවල ද?'' සඳලිගේ උපහාසාත්මක ස්වරය ඔහුගේ සිතේ ඇති කළේ කෝපයකි.

''මම හොස්පිට්ල් එක ඇතුළට ආවා. දැන් ෆෝන් එක ඕෆ් කරන්න වෙනවා.'' ඔහු කීවේ කතාව කෙටි කරන අටියෙනි. සඳලි ඒ බව වටහා ගත්තා ය. දුරකතනය විසන්ධි කරදදී ඇගේ අපහාසාත්මක සිනාව ඔහුට හොඳින් ඇසුණි.

''මේ දේවල් සිද්ද වුණේ මගේම වරදින්.'' ඔහු විදුලි සෝපානයට ඇතුල් වන අතර සිතුවේ ය.

**ළබන කළාපයට**




# දිග පළල නොදැන දිගු කලක් බලා සිටින ක්‍රීඩා තරුව - අනිල්



අනිල් ලින්කන් රිදීගම්මානගෙදර ඒ ඔහුගේ සම්පූර්ණ නමය. එහෙන් ලින්කන් යන්න ඔහු වෙනුවෙන් නිතර භාවිතයට ගැනෙන්නේ නැත.

කෙසේ වුවත් ක්‍රිකට් ක්‍රීඩකයෙකු ලෙස දස්කම් දක්වන අනිල්ගේ වාසගම ක්‍රිකට් ක්‍රීඩකයෙකුට සුදුසු නොවන තරම් දිගු වැඩිය. එය ඉංග්‍රීසි භාෂාවෙන් ලියන විට අකුරු 18 ක් උපයෝගී කරගත යුතුය. මේ නිසා ලකුණු පුවරුවක හෝ ලකුණු සටහන් පොතක ඔහුගේ නම සටහන් කිරීම තරමක් අපහ-සුය.

මද වේගපන්දු යවන්නෙකු ලෙස පන්දු යැවීමේදීත් මැදපෙළ පිතිකරුවකු ලෙස ලකුණු රැස්ක-රීමේදීත් දස්කම් දක්වන ඔහු පසුගියදා ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයින්ගේ සංගමය සංවිධානය කළ සම්මාන රාත්‍රියේදී හොඳම තුන් ඉරියව් ක්‍රීඩකයා සම්මානයත් වසරේ ක්‍රිකට් ක්‍රීඩකයා සම්මානයත් හිමි වුයේ අනිල්ටය.

කෙතරම් දස්කම් පෙන්වා ඇතත් ඔහු අවස්ථා 3 කදී ශ්‍රී ලංකා 'ඒ'' පිලට නම් කිරීම හැර ඊට වැඩි පිළිගැනීමක් මේ දක්වා ම ලැබී නැත. වාසගම දිග වැඩිවීව එයට හේතුව විය නොහැකිය.

දැනට 30 හැවිරිදි වියේ පසුවන අනිල් මාතලේ උපත ලබා ඇතත් අධ්‍යාපනය ලැබුවේ ගාල්ලේ රිච්මන්ඩ් විදුහලිනි. ක්‍රිකට් ක්‍රීඩාවට ඔහු යොමුවී ඇත්තේ එහිදීය.
විද්‍යාලයීය පළමු පෙළ ක්‍රිකට් කණ්ඩායමේ උපනායකයා දක්වා ගමන් කළ ඔහු පාසලෙන් ඉවත් වූ පසු ගාල්ල ක්‍රීඩා සමාජය නියෝජනය කරමින් 1995-96 තරග වාරයේදී සිය පළමු පෙළ ක්‍රිකට් තරගාවලියට සහභාගි වී ඇත.




එහිදී ඔහුගේ පළමු වන තරගයේදීම සෙබස-ටියං නයිට්ස් පිලට එරෙහිව ලකුණු 90 ක් රැස් කළේය. එම තරග වාරය නිමාවන විට ලකුණු 650ක් හා කඩුලු 30ක් ඔහු නමට ලියැවී තිබුණි.

මේ වනවිට ඔහු ගාලු ක්‍රීඩා සමාජය, ටැමිල් යුනියන්, එන්.සී.සී. හා මුවර් යන කණ්ඩායම් නියෝජනය කරමින් දේශිය පළමු පෙළ තරග වාර 11කට සහභාගි වී ඇත. එහිදී ඔහු ඉතා හොඳින් සිය කුසලතාද ප්‍රදර්ශනය කර තිබුණි. එනමුත් තවමත් ශ්‍රී ලංකා ඒ සංචිතයට අවස්ථා 3කදී තම නම ඇතුළත් වුවා මිස අවම වශයෙන් ශ්‍රී ලංකා ඒ පිල වෙනුවෙන් හෝ තම රට නියෝජනය කිරීමේ වාසනාව ඔහුට හිමි නොවීම කණගාටුදායකය.
මේ ආකාරයෙන් ඇති වී, මතු වී, නැති වී යන ක්‍රිකට් ක්‍රීඩකයින්ට ශ්‍රී ලංකාව හොඳ තෝතැන්නකි.

ශාරීරික යෝග්‍යතාව තමන්ට බාධා නොක-රන්නේ නම් අවුරුදු 37 ක් දක්වාම ක්‍රිකට් ක්‍රීඩාවේ නියැලෙන්නට බලාපොරොත්තු වන බව සම්මාන රාත්‍රියේ මාධ්‍ය හමුවේ ප්‍රකාශ කළ ඔහු එසේ කළ හැකි නම් තමන්ට දේශීය පළමු පෙළ ක්‍රිකට් පිටියේ වසර 20ක චාරිකා-

*අනිල් ශ්‍රී ලංකා පිලට එක්වීමට දිගු කාලයක් බලා සිටියේය. තවත් දිගු කලක් වුව බලා සිටින්නටද සුදානම්ය.*

වක් සටහන් කළ හැකි බවද සඳහන් කළේය.

දේශීය පළමු පෙළ ක්‍රිකට් තරගාවලියේදී දස්කම් දක්වන ක්‍රිඩකයින් කෙරෙහි අවධානය යොමු නොකරන්නේ නම් එවන් තරගාවලියක් පැවැත්වීමේ තේරුමක් ඇත්දැයි තමන් නොදන්නා බව පැවසු අනිල් ක්‍රිකට් පිටියෙන් සමුගන්නා දවස දක්වාම එක් වරක් හෝ ශ්‍රී ලංකා පිලට ක්‍රීඩා කිරීම් බලාපොරොත්තුව අත් නොහරින බවද සඳහන් කර තිබුණි.
සෑම වසරකම දේශීය පළමු පෙළ තරග වාරය අවසානයේ එංගලන්තයේ ලැන්ක්ෂයර් ලීග් ක්‍රිකට් තරගාවලියට සහභාගි වන අනිල් මෙවරද ඇෂ්ටන් ක්‍රිකට් සමාජය වෙනුවෙන් ඊට සහභාගි වීමට නියමිතය.

මෙම තරගාවලියටම ක්‍රීඩා කරන සුරේෂ් රෙයිනා අද ඉන්දීය පිලට ක්‍රීඩා කර ඇති බව පවසන අනිල් තමන්ට අවස්ථාව නොදෙන්නේ වයස නිසා නම් එයද සාධාරණ නොවන බව පැවසීය.
ක්‍රිකට් ක්‍රීඩකයකුගේ හොඳම කාලය උදාවෙන්නේ අවුරුදු 30 දී බව ඔහුගේ අදහසය. එයට උදාහරණ ලෙස අනිල් දක්-වන්නේ ඕස්ට්‍රේලියාවේ මයිකල් හසී ය. කොහොම නමුත් තමන්ගේ වාසනාව අද උදාවනු ඇතැයි, හෙට උදාවනු ඇතැයි ඔහු තවමත් බලා සිටින්නේය.

අනිල් ශ්‍රී ලංකා පිලට එක්වීමට දිගු කාලයක් බලා සිටියේය. තවත් දිගු කලක් වුව බලා සිටින්නටද සුදානම්ය. දිග වාසගමක් ඇති ඔහුට දිග පළල එතරම් විශාලව පෙනෙන්නේද නැත.